# රෝස මලක් වැනි සුරතල් රෝසා



ජි.ජී. මිහින්දි විතුම්සා දෙව්සරී

## පිදුම

මාගේ මෙම පොත මහාමායා බාලිකා

මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ

විදුහල්පතිතුමිය සහ මාගේ පන්තිභාර

ගුරුමෑණියන්ට සහ මා හට අකුරු

කළ ගුරු මෑණිවරුන්ට ඉතා

ආදරයෙන් හා ගෞරවයෙන් පුද

කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 - 11 - 01

දවසක් මම පාසල් ගොස් මහන්සියට නිදා ගත්තෙමි. එදින මා හමුවීමට පැමිණ සිටි යාළුවන් දෙදෙනෙකි. අවදිවන විට මම ඔවුන් දුටුවෙමි.



ඒ බළල් පැටවු දෙදෙනෙකි. එක බළලෙක් සුදු, දුඹුරු, කළු වර්ණ මිශ්‍රය. අනෙක් පූසා කළු සුදුය. උගේ නහය කළුය. උගේ පතුල් කළුය. උගේ නැට්ට සහ කන් ද කළුය. එපමණක් නොව උගේ තොලෙත් කළු ලපයකි. මම උට රෝසා යැයි නම් තැබුවෙමි.



උගේ මේ අමුතු නහය කළුවීම නිසා මම රෝසාට විහිළුවට නහය කළු බබා යැයි කිව්වෙමි. මගේ කාමරයේදී පූසන් දෙදෙනා සිටින පෙට්ටියෙන් නිදහස් කළද අනෙක් පූසි බිය වී දිව්වාය. එහෙත් රෝසා මා සමග හුරතල් වුයේය.





උඟ කරන දඟකාරකම් නිසාම මම උඟට හමෙන් අල්ලා කොට්ටයට දැම්මෙමි. මම මේ දැක සිනහවෙමි.



මම උඟගේ අත්දෙක අල්ලා ගී කියමින් නටමි. මම උඟව නිදි කළෙමි. මම උඟ හට පඩිපෙළෙන් නැගීමට බැසීමට පුරුදු කළෙමි.

උඟ පුටුවට ඇඳට නැගූ වාර බොහෝය. ඇඳට නැගීම වළැක්විය හැකි වුවද පුටුවට නැගීම වැළැක්වීමට නොහැකි විය. මම උඟව පුටුවෙන් බිමට දැම්මෙමි.



වෛරසයක් හැදී උඟ සමග අනෙකා ද එළියට දැමීමට සිදුවිය.



නමුත් ඌ ඉඩක් ලැබුණු හැටියේ නිවසට පැමිණෙයි. නැවත එළියට දමයි. දවසක් රෑ ඌ සමග අනෙක් පූසා ද ගෙට ගත්තෙමි.



ඒදින පෙට්ටියක සිට ඌ මා ළගට ආවේය.

ඌ තුරුලට ගත් විට රෝසාගේ නුවන් කාන්තිමත් විය.



නමුත් උදය වන විට පූසන් දෙදෙනා එළියට දැමීය. නමුත් රෝසා මුලින් ම පිටුපස දොරෙන් ආ විට දොර වසා එළියට දැමීය. ඊ ළගට උඟ ඉදිරි දොරෙන් ද ඉන් පසු ජනේලයෙන් ද පැමිණෙයි.



කෙසේ හෝ උඟගේ දගකාරකම් ඉවසා දරා සතුටින් ජීවත් වන්නෙමු.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඍදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 - 11 - 01